ලංකා ඛණිජවැලි සමාගම - 2021

------------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

ලංකා ඛණිජවැලි සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් නොකිරීම නිසා විගණනය විසින් ගණනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වන මුදල් ප්‍රවාහය රු.691,547,643ක් වූ අතර සමාගම විසින් සකස් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.347,927,208ක් විය. එසේම විගණනය විසින් ගණනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වන මුදල් ප්‍රවාහය රු.724,600,528 ක් වූ අතර සමාගම විසින් සකස් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.1,068,220,961ක් විය. | ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියල කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතය ප්‍රකාරව පිළියල කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) දේපළ පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 වන ඡේදයට අනුව, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර අපේක්ෂාවන් කලින් ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක (LKAS) 08 අනුව ගිණුම්ගත කළ යුතු වුවත්, සම්පූර්ණයෙන් ක්ෂය වී ඇතත් දැනට භාවිතයේ පවතින පිරිවැය රු.486,158,105ක් වූ දේපළ පිරියත හා උපකරණ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි. | ඉතාමත් නුදුරේම එම ස්ථාවර වත්කම් තක්සේරුවක් කර වත්කම් ලේඛණ හා නඩත්තු ලේඛණ යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර ඒ අනුව ගිණුම් වල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසාද දීමනා නිවැරදිව ගණනය නොකිරීම හේතුවෙන් රු.2,070,534ක් ප්‍රසාද දීමනා ලෙස වැඩියෙන් ගෙවා තිබුණි. | මෙම වැඩිපුර ගණනය කර ගෙවීම් කිරීම 2022 ගිණුම් වලට ගැලපීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2021 ඔක්තෝබර් 13 වන දින රු.67,932,916ක් වටිනා වීල් ලෝඩර් යන්ත්‍ර 2ක් | මෙම යන්ත්‍ර 2021.10.13 වෙනි දින මිලදී ගෙන භාවිතයට ගෙන | මිලදී ගැනීම් කාලීනව නිවැරදිව |

| | | |
|---|---|---|
| පුල්මුඩේ යන්ත්‍රාගාරයට මිලදීගෙන භාවිතයට ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර, අත්තිකාරම් ගිණුමෙහි සටහන් කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයට අදාල ක්ෂය රු.1,698,323කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර වත්කම්ද රු.67,932,916කින් අඩුවෙන් දක්වා_තිබුණි. | තිබුණද GRN පත් නිකුත් කිරීමට ප්‍රමාද වීම නිසා 2021 වර්ෂයේ වත්කම් වලට ඇතුලත් වී නොමැති බැවින් 2021 වර්ෂය සඳහා ක්ෂය රු.1,698,323ක අඩු අගයක් පෙන්වන බව හා 2022 මූල්‍ය වර්ෂය සඳහා වත්කම් ලේඛණ යාවත්කාලීන කර ඇති බව | ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 ජනවාරි 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සමාගම විසින් රු.මිලියන 500 ක මුදලක් පිහන් සංස්ථා සේවක වන්දි ගෙවීම සඳහා රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත 2012 ජනවාරි 10 දින ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මෙම ණය වෙනුවෙන් රු.155,226,434ක අඩමාන ණය වෙන් කර තිබූ අතර රු.517,421,448 ක් වූ ණය මුදල හා පොලිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. | මහා භාණ්ඩාගාරයේ උපදෙස් හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මෙම රුපියල් මිලියන 500 ක මුදල ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිත බව හා ඒ අනුව කොළඹ වානිජ මහා අධිකරණයේ පවරා ඇති නඩුව සම්බන්ධයෙන් ද අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව | මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි ක්‍රියාකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වැව්ලි සංස්ථාවට හා ජාතික කඩදාසි සංස්ථාවට ලබාදී තිබූ පිළිවෙලින් රු.25,000,000 හා රු.5,000,000 ක ණය මුදල් වර්ෂ 10කට වඩා කල්ගත වී ඇතත් අය කරගැනීමට සමාගමට නොහැකිවී තිබුණි. | රාජ්‍ය වැව්ලි සංස්ථාවට ලබාදුන් ණය මුදල වෙනුවට ඉඩම් කොටසක් ලබාදීමට එකඟ වී ඇති බව හා කඩදාසි සංස්ථාවේ මුදල ලබාගැනීමට රේඛීය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර තීරණයක් ලබා ගැනීමට නියමිත බව | මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි ක්‍රියාකිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2020 හි 1.2 උප වගන්තිය | රාජ්‍ය ආයතනයක සභාපතිවරයකු හට එක් වාහනයක් හා මසකට ඉන්ධන ලීටර 150 ක් ලබාගත හැකි බව සඳහන් කර තිබුණද ඊට පටහැනිව සභාපතිවරයා විසින් 2021 වර්ෂයේ දී ඔහුට හිමි ඉන්ධන දීමනාව ඉක්මවා | 2021 වර්ෂයට අදාළව අතිරේක ඉන්ධන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. සභාපතිට වෙන් කළ රථය අළුත්වැඩියා හා නඩත්තු සිදුකිරීමේදී හා දුර ප්‍රදේශ වල | චක්‍රලේඛ නියමයන් ඉක්මවා හා ඊට පටහැනිව කටයුතු නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉන්ධන ලීටර 8133 ක් ලබාගෙන තිබුණු අතර එහි වටිනාකම රු.1,135,748ක් විය. එසේම සභාපතිවරයා හට වෙන්කර තිබූ වාහනයේ ඉන්ධන ටැංකියේ ධාරිතාවය ලීටර 80ක් වුවද ඔහු විසින් ඉදිරිපත් කරන ලද ඉන්ධන බිල් සහිත වවුචර්පත් නියැදි පරීක්ෂාවේදී බොහෝ බිල්පත් වල ලීටර 100 ඉක්මවා ඉන්ධන ලබාගෙන තිබුණි. එසේම තමා හට වෙන්කර තිබූ වාහනයට අමතරව වෙනත් වාහන සඳහා ද ඉන්ධන ලබාගෙන තිබූ අවස්ථා දක්නට ලැබුණි. | ගමන් කිරීමේදී පහසුවෙන් යාම සඳහා සභාපතිගේ ජීප් රථ භාවිතා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී ඇති අතර එම පෞද්ගලික වාහන සඳහා ඉන්ධන ලබා දීම සිදු කර බව<br>ඉන්ධන ටැංකියේ ධාරිතාව ඉක්මවා ඩීසල් ලබාගෙන ඇත්තේ රාත්‍රී කාලයේ දී ධාවනය කිරීමත්, පුල්මුඩේ වැනි දුරබැහැර ප්‍රදේශ වල සුපර් ඩීසල් පිරවුම්හල් නොමැති නිසාත්, ඉන්ධන ටැංකියට අමතරව බූලි සඳහාද ටැංකි ධාරිතාවය ඉක්මවා සුපර් ඩීසල් මිලට ගන්නා ලද බව | |
| (ආ) 2004 මාර්තු 30 දිනැති පීඊ/පී ඩී සී ඞී/14/02 දරණ භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය. | මෙම ලිපිය මඟින් පැමිණීමේ දීමනාව රු.500 ක් අනුමත කර තිබූ අතර එයට පටහැනිව සමාගම විසින් වරින්වර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත සමාලෝචිත වර්ෂය වන විට රු.3,000ක් දක්වා වැඩි කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පැමිණීමේ දීමනාව ප්‍රධාන කාර්යාලය සඳහා රු.3,769,600ක්ද පුල්මුඩේ යන්ත්‍රාගාරය සඳහා රු.17,429,792ක්ද ලෙස භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ගෙවා තිබුණි. | 2011 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය විසින් පැමිණීමේ දීමනාව රු2,000 සහ ආහාර දීමනාව රු.150ක් ලෙස සංශෝධනය කිරීම නිර්දේශ කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. එකී නිර්දේශයට අනුව කටයුතු කර ඇත.<br>2020 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එය පිළිවෙලින් රු.3,000 ක් හා රු.200 ක් දක්වා වැඩිකර ගෙවා ඇත.<br>මෙම දීමනාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කරන බව. | භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) 2004 මාර්තු 30 දිනැති අංක සී ඊ/පී ඩී සී බී/14/02 දරණ භාණ්ඩාගාරයේ ලේකම්ගේ ලිපිය | මෙම ලිපිය මඟින් දිනකට ආහාර දීමනාව රු.35ක් අනුමත කර තිබූ අතර සමාගම විසින් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත එය වරින් වර වැඩි කර සමාලෝචිත වර්ෂය වන විට | | භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිනකට රු.200ක් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන කාර්යාලය සඳහා රු.2,738,800ක් ද පුල්මුඩේ යන්ත්‍රාගාරය සඳහා රු.26,773,600ක් ද ලෙස ආහාර දීමනාව නිසි අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ගෙවා තිබුණි. | | |
| (ඇ) ආයතන සංග්‍රහයේ XXI වැනි පරිච්ඡේදයේ වන 4 වගන්තිය | වෙනත් ශ්‍රේණිවල නිලධාරින්ට නිකුත් කළ යුතු නිල ඇඳුම් වල සහ ආරක්ෂක ඇඳුම් වල ස්වභාවය, ප්‍රමාණය සහ ඒවා නිකුත් කළ යුතු කාල සීමාව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගෙන් විමසා තීරණය කළ යුතු වුවද සමාගම එම විධිවිධාන නොසලකා සෑම වර්ෂයකම (2010 වර්ෂයේ පමණ සිට ) වෙනත් ශ්‍රේණි නිලධාරින් (කම්කරු , රියදුරු, කා.කා.ස., ආරක්ෂක, යන්ත්‍ර ක්‍රියාකරුවන් හා ක්ලීනර්වරු හැර) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නිල ඇඳුම් ලබාදී තිබුණි. 2021 වර්ෂය සඳහා සියළු නිල ඇඳුම් වෙනුවෙන් රු.12,649,118 ක වියදමක් සමාගම විසින් දරා තිබුණි. | සෙසු කාර්ය මණ්ඩලයද නිල ඇඳුම් ලබා දෙන මෙන් ඉල්ලීම් ඉදිරිපත් කිරීමෙන් පසුව සමස්ත කාර්ය මණ්ඩලයටම නිල ඇඳුම් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ලැබී ඇත. 2021 වර්ෂයේ වැය කළ රුපියල් මිලියන 12.5ක මුදල අනවශ්‍ය වියදමක් ලෙස නොව එය ආයතනයේ ක්‍රියාකාරීත්වයට සුදුසු වන පරිදි සහ සේවක අභිප්‍රේරණය පිණිස සිදු කළ වියදමක් බව | ආයතන සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,386,986,319ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. 50,797,328 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,437,783,647ක වර්ධනයක් නිරීක්ෂණය විය. 2020 වර්ෂයට අදාල ඉල්මනයිට් ටෙන්ඩරයේ තොග අලෙවිය සමාලෝචිත වර්ෂයේ සිදුවීම හා ගිණුම්ගත කිරීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දී වටිනාකම රු.403,419,895ක ස්ථාවර තැන්පතු 4ක් කල් පිරීමට පෙර මුදල් කර ගැනීම හේතුවෙන් ලැබීමට තිබූ රු.1,475,582ක පොලී ආදායමක් සමාගමට අහිමි වී ගොස් තිබුණි. එසේම 2021 ජනවාරි 01 දිනට වටිනාකම රු.2,293,478,814ක් වූ ස්ථාවර තැන්පතු සමාගම සතු වූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එය රු.1,500,001,000ක් ද 2022 ජූනි වන විට රු.1,300,001,000ක් ද වී තිබුණි. මින් රු.500,000,000ක් ආනයන සඳහා ඇප වශයෙන් තබා තිබුණි. | ජනවාරි සිට නොවැම්බර් දක්වා කිසිදු ටෙන්ඩරයක් සිදු නොවුනු බැවින් එදිනෙදා වියදම් පියවා ගැනීමට ස්ථාවර තැන්පතු යොදා ගැනීමට සිදු විය. | ආයතනයට උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) සමාගමේ පුරප්පාඩු වූ සාමාන්‍යාධිකාර තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගන්නා තෙක්, වැඩ බැලීමට 2020 නොවැම්බර් 12 දින සිට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයකු (භූ විද්‍යාඥ) පත් කර තිබුණි. මෙම නිලධාරියා සතියකට දින 3ක් රාජකාරී වලින් නිදහස් කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සභාපතිගේ අනුමැතිය ලැබ් තිබුණද 2020 නොවැම්බර් මස සිට 2021 මැයි මස දක්වා සාමාන්‍යාධිකාරි තනතුරේ වැඩ බැලිම සිදුකළ රාජකාරි දිනයන් වෙනුවෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ඉල්ලීමට අනුව රු.414,760ක් ප්‍රතිපූරණය කර තිබුණි. මෙම කාලයට අදාලව රු.560,032 ක් සමාගම විසින් වැඩ බැලීම වෙනුවෙන් සාමාන්‍යාධිකාරිවරයා හට ගෙවීම් කර තිබුණි. මේ අනුව වැඩ බැලිම වෙනුවෙන් සාමාන්‍යාධිකාරිවරයා හට එකම කාල පරිච්ඡේදයක් වෙනුවෙන් ද්විත්ව ගෙවීමක් කර තිබුණි. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිතීරීති වලට අනුව කිසියම් නිලධාරියෙක් වෙනත් ආයතනයක රාජකාරි සඳහා මුදාහැරියහොත්, ඔහු එම ආයතනයේ සේවය කරන කාල සීමාවට අදාලව සමානුපාතිකව ගෙවා ඇති මුදල ප්‍රතිපූර්ණය කළ යුතු වේ. ඒ අනුව ප්‍රතිපූර්ණය කළ යුතු වූ මුදල ඔවුන් වෙත ලබා දෙන මෙන් අප ආයතනයෙන් ඉල්ලීම් කර ඇත. මෙම මුදල ප්‍රතිපූර්ණය කිරිම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.<br>මීට අමතරව සාමාන්‍යාධිකාරීට අප ආයතනයෙන් මූලික වැටුපෙන් 25%ක මාසික දීමනාවක් සාමාන්‍යාධිකාරි තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් ගෙවා ඇත. | එකම කාල පරිච්ඡේදයක් වෙනුවෙන් එකම කරුණකට අදාලව ද්විත්ව ගෙවීමක් නොකළ යුතුය. |
| (ඇ) කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබූ රු.2,671,088ක් වූ වියදම් 2014 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනවිත් තිබූ අතර එම වියදම් වලට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක නොවන බව කළමනාකරණය සමඟ සිදු කරන ලද සාකච්ඡාවේ දී අනාවරණය විය. එසේ වුවද නිශ්කාර්ය වූ මෙම වියදම් කෙරීගෙන යන වැඩ ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් ඉදිරියට ගෙන එමින් පැවතුණි. | එකල පැවැති විවිධ කළමනාකාරීත්වයේ තීරණ අනුව එම ව්‍යාපෘති අතරමඟ නවතා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර උපදෙස් හා අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වියදම් නිශ්කාර්ය නොවීමට කළමනාකාරීත්වයේ අවධානය යොමුවිය යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ගත ඉල්මනයිට් විකුණුම් ප්‍රමාණය මෙ.ටො.50,000ක් වූ අතර අවසන් ගිණුම් අනුව සත්‍ය විකුණුම් ප්‍රමාණය මෙ.ටො 79,947ක් විය. නමුත් එය 2020 ඔක්තෝබර් 28 දිනැති මෙ.ටොන් 85,000ක අලෙවි ටෙන්ඩරයට අදාල විකුණුම් වන අතර 2021 වර්ෂයට අදාලව ඉල්මනයිට් විකුණුම් සිදු වී නොතිබුණි. ලංසුකරු සමඟ 2020 නොවැම්බර් 09 දින එළඹි ගිවිසුමෙහි 5 වන කොන්දේසියට අනුව දින 130ක් ඇතුලත තම තොගය කොටස් 4කින් නිදහස් කරගත යුතුව තිබුණද එය 2021 අගෝස්තු 15 දක්වා වීමෙන් තවත් වැඩිපුර දින 150 ක පමණ ප්‍රමාදයක් වී තිබුණි. එසේම ඇ.ඩො 12,495,000ක් වූ ටෙන්ඩරයේ දෙවන හා තුන්වන මුදල් ගෙවීම් හා තොග ඉවත් කිරීම ප්‍රමාද වුවද හතර වන මුදල් ගෙවීම හා තොග ඉවත් කිරීම වෙනුවෙන් පමණක් ප්‍රමාද ගාස්තු වශයෙන් රු.1,107,992ක් පමණක් ගැනුම්කරුගෙන් අය කරගෙන තිබුණි. | මෙ.ටො.85,000 ක් වූ ඉල්මනයිට් ටෙන්ඩරය 2020 ඔක්තෝම්බර් මස 28 දින ප්‍රදානය කළ අතර, ආයතනයේ ඉහල කලමනාකාරිත්වය විසින් ටෙන්ඩර මුදල ගෙවීම සඳහා හා තොග ඉවත් කරගැනීම සඳහා දින වකවානුවක් සඳහා කාලය දීර්ඝ කර දෙන ලදි. නියමිත කාලය තුල ඉවත් කර ගැනීමට නොහැකි වූ එම තොග ඉවත් කර ගැනීම සඳහා රු.1,107,992 ක මුදලක් ප්‍රමාද ගාස්තු වශයෙන් අය කරන ලදි. | විකුණුම් ක්‍රියාවලිය, පවතින අධිකාරී සීමාව තුල සැලැස්මකට අනුව අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.. |
| (ආ) ඛනිජ වැලි බහුල කෝකිලායි ප්‍රදේශයෙන් 2013.02.13 දින රු.මිලියන 2.25 ක මුදලකට හෙක්ටයාර් 17.69ක ඉඩමක් මිලදීගෙන තිබුණු අතර මෙම ප්‍රදේශයේ යන්ත්‍රාගාරයක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි . ඉඩම නිසි පරිදි පවරාගෙන නව යන්ත්‍රාගාරයක් ඉදිකිරීමටත් පෙර 2013 අගෝස්තු මස යන්ත්‍රාගාරය සඳහා රු 39,339,473.ක් වටිනා වත්කම් මිලදීගෙන එම වත්කම් සියල්ල පුල්මුඩේ යන්ත්‍රාගාරයේ වෙනත් ස්ථානවල ස්ථාපිත කර නිශ්කාර්යව තිබූ අතර ,ඇතැම් යන්ත්‍ර ගබඩාවේ නිශ්කාර්යව ගොඩ ගසා තිබුණි. කෝකිලායි ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගෙන Block A පැරණි යන්ත්‍රාගාරයේ සවිකර තිබූ Spiral24 ක් ගලවා දමා එළිමහනේ අනාරක්ෂිතව තිබුණු අතර අදාළ Spiral යන්ත්‍ර මිලදීගත් 2013 අගෝස්තු මස සිට භවිතයට නොගෙන නිශ්කාර්යව තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය සඳහා බලපත්‍ර ලබාගැනීමේ අපහසුව තිබියදී හා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර 2015 ජුනි 25දින සේවකයන් 117 දෙනෙකු බඳවාගෙන තිබුණ අතර පසුව යන්ත්‍රාගාරයේ විවිධ ස්ථාන සඳහා ඔවුන්ව අනුයුක්ත කර තිබුණි.<br>කෝකිලායිහි නව යන්ත්‍රාගාරය ඉදිකිරීමේ අරමුණ වූයේ ඛනිජවැලි ලබාගැනීම, එහි | කෝකිලායි නව ඛණිජවැලි යන්ත්‍රාගාරය ස්ථාපිත කිරීම සඳහා 2019 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු 2020 ඛනිජ වැලි කැණීම සඳහා කැණීම් බලපත්‍රයක් ලබාගන්නා ලදී. 2022 දී ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම සඳහා භාරදුන්නද අදාල කාල පරිච්ඡේදය තුල වාර්තාව නොලැබුණි.<br>යෝජිත යන්ත්‍රාගාරයට වෙන් කරන ලද ඉඩමේ කොටසක් වර්ෂා කාලයේ දී ජලයෙන් යට වන නිසා කණින ලද ඛනිජ වැලි ගබඩා කිරීම සඳහා යෝජිත එම ඉඩමේ පස් පිරවීම ව්‍යාපෘති යෝජනාව සකස් කිරීමට පෙර සිටම සිදු කරන ලදී.<br>ට්‍රාන්ස්පෝමරය සවි කිරීමට පෙර එම ඉඩම් කොටස අයත් වන ප්‍රදේශයද පස් පුරවා ට්‍රාන්ස්පෝමර් ගොඩනැගිල්ල සෑදිය යුතුව තිබුණි.<br>කෝකිලායි නව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම 2015 වර්ෂයේදී බඳවා ගත් සේවකයින් 117 දෙනා මේ වන විට යන්ත්‍රාගාරයේ විවිධ අංශයන් හි සේවයේ නියුක්තව වෘත්තීය නිපුණතාවයන් ලබා ඇති අතර, | කෝකිලායි ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කළ යුතු අතර යන්ත්‍රසූත්‍ර ද නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගෙන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නිෂ්පාදනය වැඩි කිරීම හා නිෂ්පාදනයට එකතු කළ අගයක් ලබාදීම වූ අතර මෙය ඉදි කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මේ රු.මිලියන 1000ක් වෙන් කර තිබුණි. එසේ වුවද 2022 ජුලි අවසන් වන විටත් ව්‍යාපෘති යෝජනාව (Project Report) සකස් කිරීම නිම කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. 2022 ජනවාරි 01 දින කෝකිලායි ප්‍රදේශයේ සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී එහි පස් පිරවීම් කටයුතු සිදු කරමින් පැවති අතර ව්‍යාපෘති යෝජනාව සකස් කර නොමැති නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකශන අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් රු.17,767,504ක වියදමක් ද දරා තිබුණි. | කෝකිලායි යන්ත්‍රාගාරය ආරම්භ කිරීමෙන් පසුව, අදාල ක්ෂේත්‍රයන් හි නිපුණතාවයෙන් යුතු සේවක පිරිසක් එහි සේවයේ යෙදවීමට හැකි වේ. | |
| (ඇ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් වසර 30ක බද්දකට රු.24,220,118ක් ගෙවා ඛනිජ වැලි සමාගමේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී ලබාගෙන තිබුණි. වර්ග අඩි 15,325 ක මහල් 06 කින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.171,453,486 කට 2018 පෙබරවාරි කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර එය 2021 ජුනි 02 දින කොන්ත්‍රාත් වටිනාකම රු.175,224,359ක් ලෙස (වැට් රහිත) නැවත සංශෝධනය කර තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.6 වගන්තිය ප්‍රකාරව ලංසුකරුවකු විසින් ඉදිරිපත් කරන ලද ලංසුව ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසු වහාම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතු වුවත්, කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම අත්සන් කර තිබුණේ 2020 පෙබරවාරි 26 දින එනම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වසර 02ක් ගතවීමෙන් පසුව විය. වසර 30ක බදු කාලයෙන් 2022 ජුනි අවසන් වන විට වසර 09ක් ගෙවී ඇති මුත් එහි ටයිල් අතුරා අභ්‍යන්තර නිර්මාණ කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | නව ගොඩනැගිල්ල ඉදි කිරීමට 2018 පෙබරවාරි 27 දින කොන්ත්‍රාත්තුව ලබා දුන්නද වරින් වර සිදු වන කළමනාකාරිත්වයේ වෙනස්වීම මත ගොඩනැගිල්ල ඉදිකිරීමට ඒකමතික තිරණයක් නොමැති වීම නිසා ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කර තිබිණි. වැඩ නිම කිරීමට යෝජිතව තිබු 2022 ජුලි මස 13 වන දිනය පසුවී ඇති නමුත් පවත්නා ඉන්ධන අර්බුධය හේතුවෙන් ජන ජීවිතයට පවතින පිඩාකාරිතත්වය වැඩිවීම, නිම කිරීමට අවශ්‍යවන අමුද්‍රව්‍ය හිඟය ආදිය නිසා ප්‍රමාදය සිදුවි ඇත. | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම කඩිනම් කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත ඉල්මනයිට්, හයිටයි ඉල්මනයිට්, රුටයිල් හා ස(ර්)කෝන් නිෂ්පාදනය පිළිවලින් මෙ.ටොන් 50000 , 6020 , 4800 හා 1800 ක් වූ නමුත් සත්‍ය වශයෙන්ම නිෂ්පාදනය මෙ.ටොන් 44700 , 4368 , 1880 , 400 ක් විය. ඒ අනුව සමාගමට බලාපොරොත්තු වූ නිෂ්පාදනය ලබා | සමාගමට අපේක්ෂිත වර්ෂය තුළ අය වැය ගත නිෂ්පාදන ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වූයේ රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වයත් 2020 වර්ෂයේ අලෙවි කරන ලද ඉල්මනයිට් මෙ.ටො.85,000ක් වූ තොග නිසි පරිදි ඉවත් කර නොගැනීම හේතුවෙන් ගබඩා | විකුණුම් ක්‍රියාවලිය, පවතින අධිකාරී සීමාව තුල සැලැස්මකට අනුව අපේක්ෂිත ඉලක්ක ළඟාකර |

| | | |
|---|---|---|
| කර ගැනිමට නොහැකි වී තිබුණි. එසේම 2020 ඔක්තෝබර් මස ටෙන්ඩර් කර ලබා දී තිබූ මෙ.ටොන් 85,000 ක ඉල්මනයිට් තොගය ගැනුම්කරු විසින් නිසි පරිදි ඉවත්කර නොගැනීම හේතුවෙන් හා ගබඩා වල ධාරිතාවය ඉක්මවා ගොස් තිබීම නිසා 2021 මාර්තු දක්වා " Block B " යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු නවතා දමා තිබුණි. ඒ හේතුවෙන් මානව සම්පත් ඇතුළු සියළුම සම්පත් නිශ්කාර්ය වී තිබුණි. | ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවුනු නිසා Block B යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු නතර කිරීමට සිදු වීමෙන් Hi Titanium, Rutile සහ Zircon නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය වන විචුම්භක වැලි නොලැබීමයි. | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දී Low grade Zircon crude, Final Talien සහ Hydro sized Fines වල කිසිදු ආදායමක් ලැබී නොතිබුණු අතර ඇස්තමේන්තු ආදායමට වඩා Rutile සියයට 85 කින් හා Zircon සියයට 75කින් අඩු වී තිබුණි. හයිටයි ඉල්මනයිට් මෙ.ටොන් 4,368 නිෂ්පාදනය කර ඇති අතර ආරම්භක ශේෂය මෙ.ටො 3,210.51 ක් විය. මෙම වර්ෂයේදී, හයිටයි ඉල්මනයිට් කිසිදු අලෙවික් සිදු නොවීම හේතුවෙන් එම ගබඩා පිරීයෑම නිසා අනාරක්ෂිතව එලිමහනේද ගොඩගසා පැවතිණි. එසේම සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් මාසය දක්වා ඛනිජ වැලි නිෂ්පාදන විකිණීම සඳහා ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් ඉදිරිපත් වී නොතිබුණු අතර LMS/MKT/TDR/21/01 දරණ ටෙන්ඩරය සඳහා මිල විමසුමක් ඉදිරිපත් කර ඇත්තේද 2021 ඔක්තෝබර් 21 දින එනම් වර්ෂයේ මාස 09ක් ගත වීමෙන් පසුව විය. ඒ සඳහාද අපේක්ෂා කළ පරිදි මුළු විකුණුම් ප්‍රමාණය ලබා ගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි. | ආයතනයේ ඉහල කළමනාකාරිත්වය විසින් මෙම අර්ධ නිෂ්පාදන තව දුරටත් පිරිසැකසුම් කර එහි ඇති ඛනිජවැලි වෙන්කර අදාළ නිෂ්පාදන සෑදීමට තීරණය කිරීම නිසා මෙම නිෂ්පාදන අලෙවිය සඳහා 2021 වර්ෂය තුළදී ඉදිරිපත් නොකිරීමට තීරණය විය. අමාත්‍ය මණ්ඩලය විසින් අලෙවිය සඳහා නිසි ක්‍රියාවලියක් සාදා එමගින් නිෂ්පාදන අලෙවි කිරීමට නියෝග ලබාදුනි. එම නියාමන ව්‍යාපෘතිය (PILOT PROJECT) යටතේ ප්‍රධාන නිෂ්පාදන වල සැලකිය යුතු ප්‍රමාණයක් LMS/MKT/TDR/21/01 ටෙන්ඩරය යටතේ අලෙවි කිරීමට කටයුතු කර, එහි ප්‍රගතිය බලා තවදුරටත් අලෙවි ක්‍රමවේදය සංශෝධනය කර නියාමන ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2022 ජුනි මස 20 වන දින ලබා දී ඇත. | නියාමන ව්‍යාපෘතිය යටතේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කර උපරිම තරඟකාරිත්වයක් තුලින් ඉහල මිලක් හා අලෙවියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ප්‍රධාන කාර්යාලය හා පුල්මුඩේ යන්ත්‍රාගාරය විසින් 2020 හා 2021 වර්ෂයන්හි දී සැපයුම්කරුවන් වෙත ලබා දී තිබූ පිළිවෙලින් රු.2,924,232ක හා රු.1,083,100ක අත්තිකාරම් 2022 මැයි 31 දින වන විටත් පියවා නොතිබුණි. | නිෂ්පාදන විකිණීම සඳහා සාර්ථක ක්‍රමවේදයක් සැකසීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | අත්තිකාරම් කඩිනමින් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොවිඩ් 19 වෛරසය පැවතීම හේතුවෙන් 2021 වර්ෂයේ පළමු මාස 04 සඳහා කුලී පදනම මත ලබාගත් වාහන 05ක් වෙනුවෙන් රු.4,172,595 ක් වැය කර ප්‍රධාන කාර්යාලයේ සේවකයන් හට ප්‍රවාහන පහසුකම් ලබා දී තිබුණි. එම මාස සඳහා සේවකයන් හට | කොවිඩ් 19 වසංගත සමයේදී පොදු ප්‍රවාහනය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සහ පළාත් අතර සංචරණය තහනම් කර තිබීම නිසා සියළු කාර්යයන් ඉටු කිරිමට කුලී පදනම මත වාහන ලබාගෙන ප්‍රවාහන පහසුකම් ලබා දී | එකම කාර්යයක් වෙනුවෙන් ද්විත්ව ගෙවීම් නොකළ යුතුය. ද්විත්ව ගෙවීම් අයකර ගැනීමට |

| | | |
|---|---|---|
| ප්‍රවාහන දීමනාව ලෙස රු.2,626,500 ක්ද ලබා දී තිබුණි. පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයන් හටද ආයතනයේ වාහනය මගින් ප්‍රවාහන පහසුකම් ලබා දී ප්‍රවාහන දීමනාව ලෙස රු.15,379,520 ක් ගෙවා තිබුණි. මේ අනුව එකම කාර්යයක් වෙනුවෙන් ද්විත්ව ගෙවීමක් සිදුවී තිබුණි. | සියළුම කාර්ය මණ්ඩලය සේවයට කැඳවීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි කටයුතු කරන ලදි. ප්රවාහන පහසුකම් සලසා සේවකයින් සේවයට කැඳවීම් කළ අවස්ථාවේදි ගෙවනු ලැබූ ප්‍රවාහන දීමනාවෙන් 30% ක් පමණ කපා හැරීමට ආයතනය විසින් කටයුතු කරන ලදි. | කටයුතු කළ යුතුය. |
| (ආ) කොවිඩ් 19 වෛරසය සමයේ කුලී පදනම මත වාහන ලබාගත් ආයතනයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන්නේ ඛනිජ වැලි සමාගමේ වත්මන් සභාපතිවරයා වන අතර වාහන ලබා ගැනීමේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සිදු වී ඇතත් ලංසුකරුවෙකු තෝරා ගැනීමේ දී හා සමාගම විසින් ඒ සඳහා රු.4,172,595ක ගෙවීම් කිරීමේ දී විනිවිදභාවයෙන් යුතුව කටයුතු කර නොතිබුණි. | ආයතනයේ අධ්‍යෂක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබූ මිල ගණන් අතරින් A.V.M. Amarasinghe ආයතනයෙන් කුලී පදනම මත වාහන ලබා ගැනීමට කටයුතු කර ඇත. එම ආයතනය D.S.Gunasekara ආයතනයෙන් කුලි පදනම මත වාහන ලබාගෙන ඇත. මෙසේ D.S.Gunasekara සමාගෙමෙන් වාහන ලබා ගෙන අප ආයතනයේ සේවකයින් කිරීම අප ආයතනයේ පාලනයෙන් තොරව සිදු වී ඇති ක්‍රියාවලියකි. | සබැඳියාවන් අතර ගැටුම්වලට තුඩුදෙන ගනුදෙනු සිදු නොකළ යුතුය. |
| (ඇ) 2020 පෙබරවාරි 03 වන දින සිට කොන්ත්‍රාත් පදනම මත රියදුරකු හා 2021 නොවැම්බර් 15 දින සිට තවත් රියදුරකුද ලෙස එකවර රියදුරන් දෙදෙනෙකු සභාපතිවරයාට වෙන් කර තිබූ රථයේ රාජකාරි කටයුතු සඳහා පත්කරගෙන තිබුණි. මෙම රියදුරන් දෙදෙනාගේ අතිකාල දීමනා පරීක්ෂාවේ දී රියදුරන් දෙදෙනාම එකම අවස්ථාවේ දී අතිකාල ලබාගෙන තිබුණු අතර බොහෝ අවස්ථාවල දී මැදියම් රය පසුවන තුරු පුල්මුඩේ යන්ත්‍රාගාරය වෙත යාම වෙනුවෙන් අතිකාල ලබාගෙන ඇති නමුත් පුල්මුඩේ යන්ත්‍රාගාරයේ වාහන පැමිණීමේ හා පිටවීමේ වාර්තා පරීක්ෂා කිරීමේ දී සභාපතිවරයා එම දිනයන්හි පුල්මුඩේ යන්ත්‍රාගාරය වෙත පැමිණි බවට සාක්ෂි නොමැති විය. මොවුන් දෙදෙනා සමාගමේ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ තම පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණු අතර සභාපතිවරයා විසින් ඔවුන්ගේ පැමිණීම හා පිටවීම් වාර්තා අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී වැටුප්, දීමනා හා අතිකාල ලෙස මෙම කොන්ත්‍රාත් රියදුරුට හා අනෙක් රියදුරුට පිළිවෙලින් රු.1,250,986 ක් හා රු.1,726,712 ක් ගෙවා තිබුණි. | සභාපති තුමා කොළඹ ප්‍රදේශයේ සිට රාජකාරි කටයුතු සඳහා දුර බැහැර දිවා රාත්‍රී යන යන බැවින් හා එක් රියදුරෙකු නිවාඩු ලබා ගැනීමේදී හා ලබාගත හැකි අතිකාල සීමාව ඉක්මවා යාමේදී රියදුරන් දෙදෙනෙකුගේ සේවය යොදා ගන්නා ලදී. අදාළ පැමිණීම පිටවීමට අදාළව සභාපති තුමා විසින් පැමිණීම පිටවීම සහතික කරන අතර අතිකාල ලබා දීමද සිදුකරයි. සභාපතිතුමා යන්ත්‍රාගාරය වෙත පැමිණීමේ දී හා පිටවීමේදී බොහෝ අවස්ථාවල ප්‍රධාන පිවිසුම් දොරටුවේ සටහන් නොකරන නමුත් නිල නිවායේ ලොග් පොතෙහි සඳහන් කරනු ලැබේ. එමෙන්ම කෝකිලායි වැඩබිම, යාන්ඔය වැඩබිම සහ කොඩ්බේ වැඩබිම ආදී ස්ථාන වලටත් IEA හා EIA රැස්වීම් සඳහා (ත්‍රිකුණාමලය අවට) සහභාගී වන නමුත් පුල්මුඩේ යන්ත්‍රාගාරය වෙත නොගොස් නැවත කොළඹ බලා පිටත් වීම සිදු කරනු ලබයි. | අයතා බඳවා ගැනීම් නොකළ යුතු අතර අනිසි ගෙවීම් නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර වල සභාපතිවරයෙකු හට තමාට පෞද්ගලික වන සේ නිලධාරීන් ලබා ගැනීමේ හිමිකමක් නොමැති වුවද, සභාපතිවරයා ඔහුගේ පෞද්ගලික ආරක්ෂක ලෙස සමාගමේ සේවකයින් දෙදෙනෙකු අනුයුක්ත කර ගෙන තිබුණි. මෙම සේවකයන් දෙදෙනා සමාගමේ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ තම පැමිණීම හා පිටවීම සටහන් නොකරන අතර පැමිණීම හා පිටවීම් වාර්තා සභාපතිවරයා විසින් අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී මෙම සේවකයන් දෙදෙනාගේ වැටුප්, දීමනා හා අතිකාල ලෙස සමාගම විසින් රු.1,766,704ක් වැය කර තිබුණි. | සභාපතිතුමාගේ ඉල්ලීම පරිදි පෞද්ගලික ආරක්ෂක ලෙස ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක අංශයේ සේවයේ නිරත ආරක්ෂක නියාමකයෙකු සහ සභාපතිතුමාගේ රාජකාරි කටයුතු සඳහා යන්ත්‍රාගාරයේ ආරක්ෂක නියාමකයෙකුද අනුයුක්ත කිරිමට කටයුතු කර ඇත.<br>කෙසේ වෙතත්, මේ වන විට අදාල ආරක්ෂක නියාමකයින් දෙදෙනා ප්‍රධාන කාර්යාලය සහ පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවය සඳහා කැඳවා ඇති බව දන්වා සිටිමි. | අයතා බඳවා ගැනීම් නොකළ යුතු අතර අනිසි ගෙවීම් නොකළ යුතුය. |
| (ඉ) අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් 2021 සැප්තැම්බර් 28 දින සිට වසරක කාල සීමාවකට සමාගමේ දැනට වැඩ බලන සාමාන්‍යාධිකාරීවරයා කොන්ත්‍රාත් පදනම මත නැවත එම තනතුරට පත් කර තිබූ අතර අදාල වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරට සමාන මාසික දීමනාවක් හා එම තනතුරට හිමි අනෙකුත් වරප්‍රසාද සහ පහසුකම්ද සලසා දීම කළ යුතු බව දක්වා තිබුණි. එසේම සමාගමේ රාජකාරී කටයුතු සඳහා නිවසේ සිට ප්‍රධාන කාර්යාලයට ඒමට, යාමට සහ ආයතනයේ වෙනත් රාජකාරි කටයුතු සඳහා ද, පුල්මුඩේ යන්ත්‍රාගාරයේ කටයුතු වලට යාමට සහ ඒමට ඉන්ධන සමඟ වාහනයක් හා රියදුරකු ද සාමාන්‍යාධිකාරීවරයාට ලබා දී තිබුණි. එසේ තිබියදී රාජකාරි කටයුතු සඳහා පුල්මුඩේ යන්ත්‍රාගාරය වෙත යාමට ඒමට දිනකට රු.12,000 බැගින් මසකට දින 10ක් සඳහා ගෙවීම් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා දී තිබුණි. මෙය අමාත්‍ය මණ්ඩල පත් කිරීමක් වන බැවින් එම පත් කිරීමට අදාල ගෙවීම් අභිබවා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ගෙවීම් කළ නොහැකි වුවද 2021 ඔක්තෝබර් සිට 2022 පෙබරවාරි දක්වා පුල්මුඩේ යාමට හා ඒමට රු.12,000 බැගින් රු.444,000ක් සාමාන්‍යාධිකාරීවරයා හට ගෙවා තිබුණි. 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාස 2 හි යන්ත්‍රාගාරයට පැමිණි බවට හෝ පිටවූ බවට ගේට්ටු වාර්තාවන්හි සටහන්ව නොතිබුණු නමුත් දින 11 ක් වෙනුවෙන් ද ගෙවීම් සිදුකර තිබුණි. | සැම සති අන්තයකම පාහේ පුල්මුඩේ යන්ත්‍රාගාරයේ කටයුතු වලට අමතරව ඛනිජ වැලි කැණීම් ප්‍රදේශ හා පුල්මුඩේ අවට ගවේශණ ප්‍රදේශ මෙන්ම සාමාන්‍යාධිකාරි විසින් ආයතනයට අලුතෙන් වෙන්කරවා ගෙන ඇති ගවේශණ ප්‍රදේශද අධීක්ෂණ කටයුතු සිදු කරයි. සති අන්තවල පුල්මුඩේ යාම වෙනුවෙන් අනුමත දීමනාවන් ඔහු විසින් ලබා නොගන්නා නිසා ඔහුගේ වසර 36 කට වැඩි අමතර විශේෂඥ දැනුම හා අමතර සේවය සලකා පුල්මුඩේ ප්‍රදේශයට යාම සඳහා මසකට උපරිම දින 10 ක් වන සේ විශේෂ දීමනාවක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.<br>කෙසේ වුවත්, 2022 අප්‍රේල් මස මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව ඔහු විසින් මෙම දීමනාව 2022 අප්‍රේල් මස සිට (අප්‍රේල් මසද ඇතුලුව) ලබා ගැනීම ප්‍රතික්ෂේප කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණයන්ට පටහැනිව කටයුතු නොකළ යුතුය. |

## 3.5 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගමේ නිෂ්පාදන කටයුතු වර්ධනය කරගැනීම සඳහා හදිසි මෙන්ම අත්‍යාවශ්‍ය මිලදී ගැනීමක් ලෙස සලකා තෙත වැලි යන්ත්‍රාගාරයට නව Hydroziser යන්ත්‍රයක් 2016 ජනවාරි මස රු.15,426,302 කට මිලදීගෙන තිබුණි. මිලදීගෙන වසර 5ක් ගතවුවද, මෙම යන්ත්‍රය නිෂ්පාදන කටයුතුවලට යොදාගැනීමට 2022 අගෝස්තු අවසන් වන විටත් සමාගම කටයුතු කර නොතිබුණි. ඒ අනුව මෙම යන්ත්‍රය හදිසි අවශ්‍යතාවයන් මත මිලදී ගත් යන්ත්‍රයක් නොවන බව පැහැදිළි වුවද යන්ත්‍රය මිළදී ගැනීම සම්බන්ධයෙන් වගකිව කිවයුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී Hydrosizer නව යන්ත්‍රය Commsion කිරිමෙන් පසු නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගත්තද, දින කීපයකට පසු විදුලි පද්ධතියේ සිදු වූ හදිසි බිඳ වැටීමකින් එහි විදුලි පරිපථයට හානි වූ නිසා ඊට අදාල අමතර කොටස් සඳහා මිල ගණන් අප වෙත ලැබී ඇති බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. නමුත් රට තුළ පවතින විදේශ විනිමය හිඟය නිසා මෙම අමතර කොටස් ලංකාවට ගෙනඒම සඳහා යම් ප්‍රමාදයක් සිදු වී ඇත. එම අමතර කොටස් ලැබුන විගස යන්ත්‍රය නැවත යථා තත්ත්වයට පත් කර නිෂ්පාදනය සඳහා භාවිතා කිරීම බලාපොරොත්තු වේ. | යන්ත්‍රය නිෂ්පාදන කටයුතුවලට යොදාගැනීමට කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) ඉන්ධන වියදම් සියයට 50 කින් ඉතිරි කර ගැනීම සඳහා රු. 62,370,234 ක් වටිනා ඩ්‍රයර් යන්ත්‍රයක් 2016 ජුනි 30 දින ආනයනය කර ඒ සඳහා රු.1,164,350 ක ප්‍රමාද ගාස්තු ඇතුළුව රු.43,838,767ක් ගෙවා තිබුණු අතර එය එදින සිට 2021 දෙසැම්බර් 31 දින වන විටත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වල අත්තිකාරම් යටතේ පෙන්වා තිබුණි. මෙය මිලදී ගෙන වසර 06ක් ගතවුවද, මෙම යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමට මෙම වාර්තාවේ දින වන විටත් සමාගමට නොහැකිවී තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඔවුනට එරෙහි ක්‍රියාමාර්ග ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කිරිමට අදාල මුර පදය ( password ) නැවත ලියා 2022 මාර්තු මස වන විට යන්ත්‍රය නැවත ක්‍රියාත්මක කරන ලදි. අපේක්ෂිත ක්‍රියාකාරි තත්ත්වයට පත් කිරීම සඳහා යන්ත්‍රය අඛණ්ඩව පරීක්ෂා කළද පවතින ඉන්ධන ගැටළුව යම් පමණකට යථා තත්ත්වයට යට පත් වීමෙන් පසුව යන්ත්‍රය ක්‍රියාකාරි තත්ත්වයට ගෙන ඒමට කටයුතු කළ හැක. | යන්ත්‍රය නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමට කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) පුල්මුඩේ යන්ත්‍රාගාරයේ දීර්ඝ කාලයකට පෙර කොඩ්බේ සඳහා මිලදී ගෙන තිබූ නයිලෝන් කඹ රෝල් තොගයක් හා රුටයිල් ටොන් 1ක් ඇසුරුම් කළ හැකි පොලිසැක් ජම්බෝ බෑග් විශාල තොගයක් භාවිතයට නොගැනීම නිසා ගබඩාවේ රඳවා තිබුණි. මෙම පොලිසැක් බෑග් අවු 11 ක සහ අවු.16ක පමණ කාලයක සිට ගබඩාවේ පැවති අතර සමාලෝචිත වර්ෂය වන විට මේවා භාවිතා කිරීමට නොහැකි තත්ත්වයට පත් වී | මෙම ඇසුරුම් ප්‍රයෝජනයට ගත නොහැකි බැවින් මීලඟ තොග සමීක්ෂණයේදී ඉවත් කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි.<br>රු.256,764 ක් වූ නයිලෝන් කඹ කෝකිලායි යන්ත්‍රාගාරයේ ස්ථාපන කටයුතු වලදී සහ බර යන්ත්‍ර සූත්‍ර මෙහෙයුම් කටයුතු වලදී යොදා ගැනීමේ අපේක්ෂාවෙන් රඳවාගෙන තිබේ. | අපහරණය කිරීමට ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | |
|---|---|---|
| තිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා තිබුණද මෙම බැග් තොගයන් ඉවත් කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාගම කටයුතු කර නොතිබූ අතර ගබඩාවේ ඉඩකඩ ද ඇහිරී තිබුණි. | | |
| (ඈ) වසර ගණනාවක සිට බැහැර කරන ලද අබලි යකඩ, පස් කපන යන්ත්‍ර, ටේලර්, ලොරි, වාහන එන්ජින්, ස්පයිරල්, ට්‍රැක්ටර්, වෑන්, JCB 5 ක් පමණ හා වෙනත් යන්ත්‍ර කොටස් යන්ත්‍රාගාර භූමියේ අනාරක්ෂිතව දමා තිබුණද ඒවා අපහරණය කිරීමට කිසිදු ක්‍රියමාර්ගයක් සමාගම විසින් ගෙන නොතිබුණි. | අබළි යකඩ, වාහන හා අනෙකුත් යන්ත්‍ර කොටස් අපහරණය කිරීම සඳහා තක්සේරු වාර්තාව ලද වහාම රජයේ ටෙන්ඩර් පටිපාටිය මඟින්, අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | අපහරණය කිරීමට ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඉ) වසර 4ක කාලයක සිට ධාවනයෙන් ඉවත් කර යන්ත්‍රාගාරයේ ගරාජය වෙත අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර තිබූ වාහන 04 ක් අළුත්වැඩියා කටයුතු අවසන් කර ධාවනය සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතියි. | කඩිනමින් අළුත්වැඩියා කිරීම කළ යුතුය. |
| (ඊ) පුල්මුඩේ යන්ත්‍රාගාරයට අයත් වසර 5ත් වසර 11ත් අතර කාලයක සිට ධාවනයෙන් තොරව පවතින වාහන 06ක් අපහරණය කිරීමට කටයුතු කළ යුතු බව සඳහන් වූවද එසේ කිරීමට සමාගම මෙතෙක් කටයුතු කර නොතිබුණි. | වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවා ඇති අතර ටෙන්ඩර් ඉදිරිපත් කළ අය එම භාණ්ඩ මිලදී ගෙන නොමැත. | චක්‍රලේඛ නියමයන් අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2004 වර්ෂයේ සිදු වූ සුනාමි ව්‍යවසනයෙන් පුල්මුඩේ යාත්‍රාංගණය විනාශවීමෙන් පසු කොඩ්බේ යාත්‍රාංගණය ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වීමෙන්, එහි තිබූ ටග් හා බත්තල් යාත්‍රා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව පැවතුණි. මෙලෙස වසර 16 කට වැඩි කාලයක සිට මෙම වත්කම් නිශ්කාර්යව දිරා පත්වෙමින් පවතින අතර මෙම වත්කම් අපහරණය කිරීම සඳහා 2021 වර්ෂයේ ටෙන්ඩර් කටයුතු සිදුකර නොතිබුණ අතර 2022 වර්ෂයේදී කොඩ්බේ ජැටියේ නැංගුරම් ලා තිබූ ටග් යාත්‍රා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ටෙන්ඩර් කැඳවා ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණද, එහි කටයුතු අවසන් වී නොතිබුණි. මෙහි ආරක්ෂාව සඳහා ආරක්ෂක නිලධාරින් 04 | මේ වන එක් බත්තලයක් සම්පූර්ණයෙන් කපා ඉවත් කර ඇති අතර, අනෙක් බත්තල් සහ ටග් යාත්‍රා ඉවත් කර ගැනීම සඳහා එම ගැනුම්කරුවන් විසින් රටේ පවතින LP ගෑස් හා ඩීසල් හිඟය මත ඉවත් කර ගැනීමේ කාලය දීර්ඝ කර දෙන ලෙස කරන ලද ඉල්ලීමකට අනුව 2022.09.02 වෙනි දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉවත් කර ගැනීමේ කාලය දීර්ඝ කර ඇත. | ඉවත් කරවීමේ ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | |
|---|---|---|
| දෙනෙකු යොදවා තිබූ අතර 2021 වර්ෂයේදී ඔවුන් වෙනුවෙන් ආරක්ෂක නිලධාරී වියදම් ලෙස රු. 3,798,988ක් වැය කර තිබුණි. | | |
| (ආ) 1997 සැප්තැම්බර් 09 දින ඉල්මනයිට් මෙ.ටො.27,235ක් පමණ පටවා තිබියදී ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් එම්.වී කොඩියැලිටි නෞකාව මුහුදු බත් වී තිබුණි. මෙම නැවේ මුළු බර මෙ.ටො. 7,763ක් පමණ වන අතර ආයතනයේ වාර්තා අනුව ආශා ලංකා ආයතනය මගින් මේ වන තෙක් ඉවත් කරගෙන ඇති යකඩ ප්‍රමාණය මෙ.ටො. 3,120 ක් පමණ වේ. 2005 වර්ෂයේ සිට මේ වන විට වසර 17ක් ගතවී ඇති අතර දෙපාර්ශවය විසින් 2021.08.27 වන දින අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම අනුව සමාගම් පරිශ්‍රයේ වසර 8ක් තිස්සේ ගොඩගසා තිබූ වැලි වලින් මෙ.ටො. 14,202ක් ඉවත් කරගෙන තිබූ අතර ආශා ලංකා ආයතනය නෞකාවේ ඉතිරි කොටස් 2022.10.30 දිනට ප්‍රථම ඉවත්කර ගත යුතු විය. ගිවිසුම් ප්‍රකාරව ආශා ලංකා ආයතනය විසින් නැව ඉවත්කර නොගැනීම හේතුවෙන් පරිසර හානියක් මෙන්ම පුල්මුඩේ විවෘත වරායේ කටයුතු ඇණ හිටීමෙන් මූල්‍යමය පාඩුවක්ද සිදුවී ඇත. | ඉල්මනයිට් තොගයේ හිමිකම ආශා ලංකා ආයතනය සතු අතර වැඩි කොටසක් මේ වන විටත් ඉවත් කරගෙන ඇත.<br>ආශා ලංකා ආයතනය මෙම නෞකාව ඉවත්කිරීම සඳහා දීර්ඝ කාලයක් තුළ අසමත්වීම පුල්මුඩේ විවෘත වරායෙන් ඛනිජ වැලි නිෂ්පාදන අපනයනය කිරීම නැවත ආරම්භ කිරීමට නොහැකි වීමට එක් හේතුවකි. එසේම මෙම නෞකාව ඉවත් කළ ද එපමණකින්ම පුල්මුඩේ විවෘත වරායෙන් ඛනිජ වැලි නිෂ්පාදන අපනයනය කිරීමට නොහැක. එයට හේතුව පුල්මුඩේ ජැටිය සුනාමිය හේතුවෙන් මුළුමනින්ම විනාශ වී පැවතීමයි. | නැව ඉවත් කරවීමට කටයුතු කඩිනම් කළ යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමස්ත ආයතනයේ නිෂ්පාදන, පරිපාලන, ගිණුම් හා අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් ගනු ලබන ප්‍රතිපත්ති හා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින සාමාන්‍යාධිකාරී තනතුර ස්ථිරව පිරවීමට කටයුතු නොකර අදාළ තනතුර සඳහා ද්විතික පදනම මත හෝ කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් බඳවාගෙන තිබුණි. | සාමාන්‍යාධිකාරි තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින්, අයදුම්පත් කැඳවීම සඳහා 2022.08.07 වන දින පුවත් පත් දැන්වීම් පල කර ඇත. | ප්‍රධාන තනතුරු සඳහා නිලධාරීන් කඩිනමින් බඳවා ගතයුතුය. |
| (ආ) සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු වන ප්‍රධාන රසඥ තනතුර වසර 11 ක සිටද වෛද්‍ය නිලධාරි තනතුර වසර 06 ක සිටද ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරි( මූල්‍ය) හා ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) යන තනතුරු 2019 අප්‍රේල් මස සිටද පුරප්පාඩුව පැවතියද අදාල තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල අනුමැතියන් ලද පසු ස්ථිර ලෙස නිලධාරින් බඳවා ගැනිමට අපේක්ෂා කරමි. | ප්‍රධාන තනතුරු සඳහා නිලධාරීන් කඩිනමින් බඳවා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති පුල්මුඩේ යන්ත්‍රාගාරයේ භූ විද්‍යාඥ තනතුරට 2021 ජනවාරි 01 දින සිට ජූනි 30 දක්වා මාස 06ක කාලයක් සඳහා රු.92,475ක මාසික දීමනාවකට කොන්ත්‍රාත් පදනම මත සභාපතිවරයා විසින් නිලධාරියකු පත්කර තිබුණු අතර ඔහු හට රු.94,375ක නිවාඩු දින දීමනා ද ඇතුලත්ව 2021 ජනවාරි සිට නොවැම්බර් දක්වා රු.1,008,604ක් ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම බඳවා ගැනීම කර ඇත. සේවා අවශ්‍යතාවය මත භූ විද්‍යාඥ තනතුරු 02 ක් ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාදෙන ලෙස වරින්වර රේඛීය අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට බැහැරව කටයුතු නොකළ යුතුය. |
| (ඈ) රාජ්‍ය ව්‍යාපාරයක සභාපතිවරයෙකු හට තමාට පෞද්ගලික වන සේ නීති උපදේශකවරයෙකු ලබා ගැනීමේ හිමිකමක් නොමැති වුවද, සමාගමේ නීති නිලධාරිනියක සිටියදී, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් නීති උපදේශකවරියක බඳවාගෙන තිබූ අතර අදාල නිලධාරිනියට 2020 දෙසැම්බර් සිට 2021 ඔක්තෝබර් දක්වා මසකට රු.75,000 බැගින් රු.750,000ක් ගෙවා තිබුණි. තවද නීති උපදේශකවරිය ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණු අතර ඇය සමාගමේ සේවයට වාර්තා කළ බවට සාක්ෂිද විගණනයට අනාවරණය නොවීය. | අමාත්‍යතුමා විසින් සභාපතිතුමාගෙන් සිදු කරන ලද ඉල්ලීමට ඉදිරිපත් කරන ලද අයදුම්පතට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සභාපතිගේ නීති උපදේශක ලෙස 2021.01.01 සිට පත්කර ඇත. 2021.01.01දිනැති මෙම පත්වීම සම්බන්ධව 2021.07.1 දිනැති ලිපිය මගින් කර්මාන්ත අමාත්‍යාංශය වෙත දැනගැනිම සහ අවශ්‍ය අනුමැතිය සඳහා යොමු කිරීමටද කටයුතු කරන ලදී. 2021.09.30 දින සිට මෙම නීති උපදේශකවරියගේ කොන්ත්‍රාත් කාලය අවසන් කර ඇත. | අයථා පත් කිරිම් නොකළ යුතුය. |
| (ඉ) 1997 දෙසැම්බර් 02 දින සිට පරිපාලන නිලධාරි තනතුර දරමින් සිටිය දී විනය පරීක්ෂණයකට අනුව චෝදනා 11කට වැරදිකරු ලෙස නිගමනය කරන ලදුව 2017 සැප්තැම්බර් 15 දින සිට සමාගමේ සේවයෙන් පහකළ පුද්ගලයෙකු නිත්‍ය තනතුරකට පත් කිරීමෙන් තොරව, සභාපතිවරයා විසින් සමාගමේ නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (මානව සම්පත්) තනතුරේ වැඩ බැලීම සඳහා රු.120,000 ක මාසික දීමනාවකට 2020 අප්‍රේල් 01 දින සිට පත්කර තිබුණි. ඉන් පසු අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත 2020 ඔක්තෝබර් 12 දින සිට පුල්මුඩේ යන්ත්‍රාගාරයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (HM1 -3) තනතුරේ වැඩ බැලීමටද පත් කර තිබුණි. අදාල නිලධාරියා වෙනුවෙන් 2020 අප්‍රේල් සිට 2022 මාර්තු දක්වා දීමනා ලෙස රු.3,081,930 ක් සමාගමෙන් ගෙවා තිබුණි. මෙම අයථා පත් කිරිම නිවැරදි කිරීමට හා ඒ වෙනුවෙන් කරන ලද ගෙවීම් සඳහා වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට සමාගම මෙන්ම අමාත්‍යාංශයද කටයුතු කර නොතිබුණි. | පාලනාධිකාරිය විසින් ගන ලැබූ තීරණයකට අනුව 2020.04.01 සිට 2020.08.30 දක්වා වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන හා මානව සම්පත්) ලෙස පත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් නොලැබීමෙන් 2020.08.30 දින සිට එම පත් කිරීම අහෝසි කර ඇත. පසුව එම නිලධාරියා විසින් අහිමිවූ රැකියාව නැවත ලබා දෙන මෙන් කරන ලද ඉල්ලීමකට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදී ඇති තීරණය ප්‍රකාරව වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන හා මානව සම්පත්) ලෙස 2020.10.12 වෙනි දින නැවත සේවයේ පිහිටුවා ඇති අතර, නැවත තනතුර ස්ථිර කර දෙන මෙන් කරන ලද ඉල්ලීමකට අනුව 2022.04.25 වෙනි දින සිට නිත්‍ය තනතුරේ පිහිටුවා ඇති නමුත්, මෙම නිලධාරියා තවත් නිලධාරියෙකු සමඟ ආරවුලක් ඇති කර ගැනීම මත හා යන්ත්‍රාගාරයේ සේවකයින් විසින් | අයථා පත් කිරිම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| තවද අදාල නිලධාරියා සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව 2022 අප්‍රේල් 25 දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) නිත්‍ය තනතුරේ ස්ථිර කර තිබුණි. | කරන ලද උද්ඝෝෂණ හේතුවෙන් මේ වන විට මෙම නිලධාරියා වැඩ තහනමට ලක් කර ඇත. | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ක්‍රියාකාරකම් 26ක් ඇතුලත් කර තිබුණි. එහි ප්‍රගතිය පරික්ෂාවේදී ඉන් ක්‍රියාකාරකම් 09 ක් ඉටු කිරීමට සමාගම අපොහොසත් වී තිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබූ සභාපති බංගලාව ලෙස යාන්ඔය ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කිරීමට සහ පුල්මුඩේ කාර්ය මණ්ඩල නිල නිවාස 12ක් අළුත්වැඩියාවට පිළිවෙළින් රු.7,686,638 ක් හා රු.1,871,862 ක් දරා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අදාළ ප්‍රතිපාදන සඳහා අනුමැතීන් ලබා ගෙන ඇති අතර, සේවකයින්ගේ පවුල් වෙත හා ආයතනයට සේවා සපයන ආයතනවල නිලධාරීන්ට මුදල් ලබාගැනීමේ පදනම මත සේවා පහසුකම් සැපයීමේ බලාපොරොත්තුව ඇතිව මෙම පැරණි අබලන්වූ සේවක නිල නිවාසය අලුත්වැඩියා කිරීමට පියවර ගන්නා ලදී.නිල නිවාස 12 අප ආයතනයේ සිවිල් ඉංජිනේරු අංශය විසින් සාමාන්‍ය අළුත්වැඩියා කටයුතු වශයෙන් සිදු කරන ලදී. | වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ලඟාකර ගත යුතු අතර වර්ෂය තුල සිදුකළ යුතු අමතර කාර්යයන් සංශෝධිත සැලැස්මට ඇතුලත් කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම රු.3,848,879,000ක් ද වෙනත් මෙහෙයුම් ආදායම් රු.24,000,000 ක්ද වූ නමුත් සමාගම ලද සත්‍ය ආදායම පිළිවෙලින් රු.2,720,198,304ක් හා වෙනත් මෙහෙයුම් ආදායම් රු.1,107,992ක් විය. එනම් සමාලෝචිත වර්ෂයේ දී සමාගමට තම අයවැය ආදායමෙන් ලඟා වීමට හැකිව තිබුණේ සියයට 70ක් පමණි. සමාගමේ අයවැයගත වියදම් රු.763,855,000ක් වූ අතර සත්‍ය වියදම් රු.840,332,629ක් විය. එය අයවැයගත වියදමට වඩා රු.76,477,629ක් එනම් සියයට 10ක වැඩි වීමකි. | රූටයිල්, සර්කෝන් හා හයි ටයි ඉල්මනයිට් අපේක්ෂිත ඉලක්කයක් අලෙවි කිරීමට නොහැකි වීම, කොරෝනා තත්ත්වය නිසා යන්ත්‍රාගාරයේ නිෂ්පාදන වර්ෂය පුරාම ප්‍රශස්ත ආකාරයෙන් සිදු කර ගැනීමට නොහැකි වීම සිදුවිය. ඉදිරියේදි ආදයම් වියදම් අවසාන ගිණුම් හා අය වැය අනුරූපිව සකස් කිරීමට කටයුතු කරනු ඇත. | අයවැයගත ආදායම් වියදම් තුල කටයුතු පවත්වා ගැනීම කළ යුතුය. |